පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 489

ආයතනයේ නම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 489

நிறுவனத்தின் பெயர் - **இலங்கைப் புகையிரதத் திணைக்களம்**

பாராளமன்றத்தின் அரச கணக்கு குழுவினால் முனவைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் **119 (4)** இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number - 489

Name of the Institution - Department of Sri Lanka Railway

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of standing order No. 119(4)

<u>පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධව නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් ඉදිරිපත් කිරීම. - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 489</u>

සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු සඳහා ප්‍ර.ග.නි./ග.නි. කරුණු පැහැදිලි කිරීම අනුව කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ			ගන්නා ලද පියවර හා එහි වර්තමාන ප්‍රගතිය
01	**<u>බෙල් සහ ලයිට් පද්ධති ස්ථාපිත කිරීම හා එහි වර්තමාන තත්ත්වය</u>** බෙල් සහ ලයිට් පද්ධති 44ක් දැනට අක්‍රිය තත්ත්වයේ පවතින බවත් ඉන් රු. මිලියන 213ක පමණ පාඩුවක් දුම්රිය දෙපාර්තමේන්තුවට සිදුවී ඇති බවත් විගණන අංශ විසින් පෙන්වා දෙන ලදී. පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන අවස්ථාවේ දී මධ්‍යගත නිරීක්ෂණ පද්ධතියක් ඇතුළත් නොකිරීම හා බෙල් සහ ලයිට් පද්ධති බිඳ වැටීම ඒකීන් මහජන ආරක්ෂාවට සිදුවූ හානිය සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානය යොමු විය.	මෙම ව්‍යාපෘතිය 2013 වසරේ දී ආරම්භ කළ ව්‍යාපෘතියක් බැවින් අදාළ කාලයේ මතුව තිබූ අවශ්‍යතාවය මත අඩු මිල්‍ය ප්‍රතිපාදන පිළිබඳ සැලකිලිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කරන්නට ඇතැයි තමා විශ්වාස කරන බව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** බෙල් සහ ලයිට් ව්‍යාපෘතිය විශේෂ ආඛාර මත සිදුකළ ව්‍යාපෘතියක් බැවින් මධ්‍යගත පද්ධතියක් තනාමැතිව පද්ධතිය සැලසුම් කිරීමට හේතු ලෙස ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රතිපාදන සීමාවීම ලෙස ලබාදුන් උපකල්පිත පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව කාරක සභාව විසින් ප්‍රකාශ කරන ලදී. මෙම බෙල් හා ලයිට් පද්ධති ස්ථාපිත කිරීම සඳහා අදාළ සමාගම තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාපටිපාටිය, වර්තමානය වනවිට ස්ථාපිත ප්‍රමාණය හා නියමාකාරයෙන් ක්‍රියාත්මක වන ප්‍රමාණයන්, මෙම පද්ධතිය නඩත්තු කිරීම හා නිසි අධීක්ෂණයක් නොවීමට බලපෑ හේතු සම්බන්ධයෙන් සහ බෙල් හා ලයිට් පද්ධතිය සඳහා මධ්‍යගත මෙහෙයුම්	නිරීක්ෂණ හා නිර්දේශවලට අනුකූලව කැඳවන ලද වාර්තාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.07.17 දිනැති ලිපිය මගින් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙය නිමා කර ඇති කරුණකි.

		පද්ධතියක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර 2024 ජූලි 5 වැනි දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.07.17 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**	
02	**<u>දුම්රිය දෙපාර්තමේන්තුවේ නායිකා මට්ටමේ සුරපුපාඩු 328ක් පිරවීමට කටයුතු කර නොතිබීම ඇතුළු සම්බන්ධ දෙපාර්තමේන්තුවේ සුරප්පාඩු රාශියක් පැවතීම</u>**	රාජ්‍ය සේවයට බඳවා ගැනීම අත්හිටුවීමේ රාජ්‍ය පුනිපත්තිය හේතුවෙන් පසුගිය විවිධ කිහිපය තුළදී නාක්ෂණික අංශයන්ට සිඳවා ගැනීම අවශ්‍ය පරිදි සිදුකර නොතිබුණ බව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශක නිලධාරිය. තවද දුම්රිය රියදුරු තනතුරේ අනුමත සේවාකාර සංඛ්‍යාවේ 458 න් පුරවද දැනට සිටින රියදුරු සංඛ්‍යාව 272 ක් පමණක් බවත් 2017 වසරින් අනතුරුව දුම්රිය රියදුරු තනතුර සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබූ බවත් ඔහු අපහේදිය දුන්නේය. **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** දුම්රිය නියාමකය, දුම්රිය රියදුරු ඇතුළු සමිස්ත අනෙකාවශ්‍යය බඳවාගැනීම් කඩිනම්වත් සිදු කිරීමටත්, අභ්‍යන්තර උසස් වීම් ක්‍රියාවලිය නිසි අයුරින් සිදු කිරීමටත් කාරක සභාව විසින් උපදෙස් ලබා දුන් අතර දුම්රිය සේවයේ බඳවා ගැනීම් හා උසස්වීම් සම්බන්ධයෙන් ඇති බාධාවන් ඉවත් කර කඩිනමින් බඳවාගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා	හෘතික මට්ටමේ පවතින [illegible] ක්‍රියාමාර්ග සම්බන්ධ තාර්කික [illegible] කර ඇත එමෙන්ම, දුම්රිය එන්ජින් රියදුරු සහතුරේ 132ක් බඳවා ගැනීම සඳහා ලද අනුමැතිය අනුව මේ වන විට 115 දෙනෙකු බඳවා ගෙන ඇති අතර ඉහිරී පුරප්පාඩු සඳහා [illegible] සිදු කිරීමට කටයුතු කරමින් පවතී. [illegible] පුරප්පාඩු සංඛ්‍යාව 65කි. මේ වන විට බඳවා ගැනීම් සඳහා ලද අනුමැතීන් අනුව බඳවා ගැනීම් ප්‍රගතිය හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුම් 02 මගින් ඉදිරිපත් කර ඇත. ප්‍රවාහන උපදෙසාර්තමේන්තුවට අදාළව නවක දුම්රිය ස්ථානාධිපතිවරුන් සහ දුම්රිය නියාමකවරුන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. දුම්රිය ස්ථානාධිපති සේවය සඳහා අභ්‍යන්තර බඳවා ගැනීම් ද ඉදිරියේ දී සිදු කිරීමට නියමිතව ඇත.

		දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සම්බන්ධ සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.12.23 දිනැති ලිඛිත මගින් අදාළ විෂයකට ඉදිරිපත් කර ඇත.**	
03	<u>වඩා කාර්යක්ෂම හා ලාභදායී කෙරෙන් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවය ප්‍රබලීත කිරීම</u>	දුම්රිය මාර්ග ඔස්සේ සංක්ෂිප්ත ප්‍රවාහන ජාලයක් ඇති කිරීම සඳහා අවධානය යොමුවී ඇති බවත් මේ පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කමිටු අමාත්‍යාංශය තුළ කමිටුවක් ද පත්කර තිබෙන බවත් ඇ.බඩා.මී. 7.5 ක ලෝක බැංකු ආධාර මුදලක් ද මෙම කටයුත්ත සඳහා ලැබීමට නියමිත බවත්, මෙම මග තුළදී ඉහලිඅත්ත සිට කොළඹ දක්වා සංක්ෂිප්ත ප්‍රවාහන නියමු දුම්රියක් ද ධාවනයට එක් කරන බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.	අදාල දුම්රිය ධාවනය සඳහා අවශ්‍ය සෙසු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු දුම්රිය ධාවනය සඳහා කාලසටහන් සකස් කිරීම සිදුකිරීම ප්‍රවාහන උප දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලැබේ. බෙලිඅත්ත සිට කොළඹ දක්වා දුම්රියෙන් එළවළු ප්‍රවාහන ව්‍යාපෘතිය ප්‍රවාහන ලේකම් විසින් ලබා දී ඇති උපදෙස් පරිදි පහත ආකාරයට ධාවනය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. i. **නව ප්‍රවාහන ගාස්තු හඳුන්වා දීම හා මාර්ගගත (online) ක්‍රමය මඟින් කලින් දුම්රියෙහි ඉඩ වෙන් කරවා ගැනීම.** මෙම දුම්රිය සඳහා අය කරන ප්‍රවාහන ගාස්තුව පවතින ගාස්තුවට වඩා අඩු අගයක් ගන්නා ලෙසත්, ධාරිතාව අනුව ගාස්තු අය කිරීම සිදු කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී. එයට අමතරව යවන්නා විසින් දුම්රිය මැදිරියෙහි ඉඩ වෙන් කර ගැනීම සහ ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව පිළිබඳව දැනුවත් වීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට කටයුතු සැලසුම් කර තිබුණි. ii. **ව්‍යාපෘතිය සඳහා ප්‍රචාරණයක් ලබා දීම.** මේ සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දී තිබුණි. 2024.08.29 දින සිට කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහන දුම්රිය ධාවනය ආරම්භ කරන ලෙස ප්‍රවාහන ලේකම් විසින් උපදෙස් ලබා දී තිබූ නමුත් ඒ සඳහා ප්‍රමාණවත් කෘෂි නිෂ්පාදන තිබිය යුතු

	බැවින්, ඒ සම්බන්ධව සොයා බැලීමට දුම්රිය සාමාන්‍යාධිකාරිගේ උපදෙස් අනුව අධිකාරී (වාණිජ) සහ නියෝජ්‍ය අධිකාරී (වාණිජ) පොදු විසින් 2024.08.23 දින දුම්රිය ධාවනය සිදු කරන කලාපවල නිරීක්ෂණ චාරිකාවක් සිදු කර ඇති අතර එහිදී පහත කරුණු හඳුනා ගන්නා ලදී. එහිදී ගාල්ල, මාතර හා හම්බන්තොට ප්‍රදේශවල වාණිජ සංගම් පවත්වා ගෙන යන බව හඳුනාගෙන ඇති අතර ඊට අමතරව එම සංගම්වල සාමාජිකයින් WhatsApp සමූහවලට එක් කර තිබීම, ගාල්ල, මාතර, හම්බන්තොට වාණිජ සංගම්වල පිළිවෙළින් 500, 600 හා 2000ක සාමාජිකයින් පිරිසක් සිටීම හා වාණිජ සංගම් විසින් මෙම ප්‍රවාහනය සම්බන්ධව අවශ්‍ය වන යම් පණිවිඩයක් WhatsApp පණිවිඩ මඟින් බෙදාහැරීම සඳහා එකඟතාව දන්වා තිබීම යන කරුණු අනාවරණය කර ගෙන ඇත. කොළඹ දක්වා ප්‍රවාහනය සඳහා සැලකිය යුතු තරමේ කෘෂි නිෂ්පාදන නොමැති බවත්, වෙනත් සුළු පරිමාණ නිෂ්පාදන පැවතිය හැකි බවත්, කොළඹ ශීට බෙලිඅත්ත දක්වා (දුම්රිය ආපසු ගමනේ දී) බිල්ලර බඩු ප්‍රවාහනයේ යම් ප්‍රවණතාවයක් තිබිය හැකි බවත් මෙම සංගම් පෙන්වා දී ඇත. වාණිජ සංගම්වල මෙම දැනුම් දීම් අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විමසා තොග පිළිබඳව නිශ්චිත අදහසක් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරන අතර ප්‍රවාහන ගාස්තු සඳහා සහනයක් ලබා දී තිබිය දී ප්‍රමාණවත් පරිදි තොග ප්‍රවාහනය නොවන්නේ නම් ව්‍යාපෘතිය අසාර්ථක විය හැකි බව ද එම නිරීක්ෂණ චාරිකාවේ දී හඳුනා ගෙන තිබුණි. ප්‍රවාහන ලේකම් විසින් ලබා දී ඇති උපදෙස් අනුව ගාස්තු සැකසීමෙන් කෘෂි නිෂ්පාදන ප්‍රවාහන ගාස්තු සාමාන්‍ය දුම්රිය ගාස්තුවට වඩා අඩු අගයක් ගන්නා අතර එම අඩුවීමේ ප්‍රතිශතය 25.99% සිට 39.78% දක්වා පවතී. දුම්රිය ආඥා පනතෙහි 03 වන වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ගාස්තු විශේෂිතව තෝරාගත් භාණ්ඩ ප්‍රවාහනයකදී උපයෝගී

	කර ගත හැකිය. ඒ අනුව 2024.07.09 දිනැති ලිපියෙන් මේ සම්බන්ධව අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කරන ලදී. කෘෂි නිෂ්පාදන දුම්රිය සාර්ථකව ආරම්භ කිරීම සඳහා දුම්රිය ස්ථානාධිපතිවරයාගේ කාර්යභාරය අතිශය වැදගත් වන බැවින්, මෙම ව්‍යාපෘතිය ආරම්භයට පෙර ව්‍යාපෘතියට අනුව දුම්රිය ස්ථානාධිපතිවරයාගේ කාර්යභාරය පිළිබඳව ඔවුන් නිසි පරිදි දැනුවත් කිරීමට ද සැලසුම් කර තිබුණි. ඉහත කරුණුවලට අදාළව එළවළු දුම්රිය ආරම්භ කිරීම පිළිබඳව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) විසින් පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් තොග පවතී ද යන්න විමසීම් කිරීම. ii. ප්‍රවාහන අමාත්‍යවරයාගේ අනුමැතිය පිළිබඳව යළි විමසීම. iii. ප්‍රවාහන අමාත්‍යවරයාගේ අනුමැතිය නොලැබුණහොත් මෙම දුම්රිය අවලංගු කිරීමට කටයුතු කිරීම. iv. ප්‍රවාහන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති විටෙක දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විමසීම් අනුව ප්‍රවාහනය පිණිස ලැබෙන තොග ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වුවහොත් ඒ පිළිබඳව ප්‍රවාහන අමාත්‍යවරයා යළි විමසා නැවත අනුමැතියක් ලබා ගැනීම. v. දුම්රිය ධාවනය ආරම්භ කිරීම සඳහා ඉහත පරිදි කටයුතු කරන බවට ප්‍රවාහන ලේකම් දැනුවත් කිරීම. vi. දුම්රිය සාමාන්‍යාධිකාරී, අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) සහ දුම්රිය ස්ථානාධිපති සංගමය සමඟ මෙම ප්‍රවාහනය සම්බන්ධව සාකච්ඡාවක් පවත්වා එහිදී ගන්නා තීරණ අනුව දුම්රිය ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමට වක්‍රලේඛයක් නිකුත් කිරීම.

04	**<u>පූර්ව කාරක සභා රැස්වීමෙදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක නොකිරීම</u>** මෙවකක අතිකාල ගෙවීමේ කුමවේදය සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් නව පවසන ලිඛිත නියෝගයේ පිටපත් විගණකාධිපතිවරයාට සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස පෙර කාරක සභාවෙදී (2019.06.21 දිනැති කාරක සභා කාර්ය සටහන්හි 8.2 ඡේදය) කරන ලද නිර්දේශය ක්‍රියාත්මක නොවීම.	දුම්රිය සේවයේ අතිකාල ගෙවීම් ආයතන සංග්‍රහයේ 8 වන පරිච්ඡේදයට පටහැනිව සිදුවී ඇති බව ද අතිකාල ගෙවීමේ කුමවේදය පෙර පරිදිම සිදු කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත සඳහන් ආකාරයට ලිපියක් නිකුත් කර තොමැති බවද කාරක සභාව හමුවේ ප්‍රකාශ වූ අතර දැනට දුම්රිය කළමනාකාධිකාරවරයා විසින් කළින් කලට ලබාදෙනු ලබන උපදෙස් හා නියම කරනු ලබන සීමාවන්ට යටත්ව අතිකාල ගෙවීම් සිදුකරනු ලබන බව පුවාහන හා මහාමාර්ග අමාතාංශයේ ම.නි. විසින් ප්‍රකාශ කරන ලදී. **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** අතිකාල ගෙවීමේ කුමවේදය සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් නිකුත් කර තොමැති බව දුම්රිය දෙපාර්තමේන්තුවේ ම.නි. විසින් ප්‍රකාශ කිරීම තුළ පෙර කාරක සභා රැස්වීමෙදී කාරක සභාව තොමඟ යවා ඇති බව ගම්‍ය වන බැවින් එසේ කාරක සභාව තොමඟ යැවූ නිලධාරියා කවුරුන්ද යන්නත්, එවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූ කරුණු කවරේද යන්නත් 2019 ජූනි 21 දින පැවති කාරක සභාවෙදී සාකච්ඡා කළ විගණන විමසුම් සම්බන්ධ විවිධාකාර තත්ත්වය ද ඇතුළත් වාර්තාවක් මාස 2ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් පුවාහන හා මහාමාර්ග අමාතාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. **පුවාහන හා මහාමාර්ග අමාතාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.12.23 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**	රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර එහි ප්‍රගතිය MT/04/14/03/02-2024 හා 2024/05/28 දිනැතිව, MT/04/14/03/02-2024 හා 2024/09/06 දිනැතිව, MT/04/14/03/01-2025 හා 2025/05/02 දිනැතිව, MT/04/14/03/01-2025 හා 2025/08/13 දිනැතිව, සහ MT/04/14/03/01-2025 හා 2025/11/13 දිනැතිව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ලිපි ලේඛණ ඉදිරිපත් කර ඇත. දුම්රිය දෙපාර්තමේන්තුවේ අතිකාල ගෙවීම් පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝජනයෙන් යුතු කමිටුව තව දුරටත් තොරතුරු පරීක්ෂා කර ගෙන යනු ලබන අතර, එම කමිටු නිර්දේශය අනුව ඉදිරි කටයුතු සිදු කරන බව වැඩි දුරටත් දන්වා සිටිමි.

05	**දුම්රිය දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කිරීමට අවශ්‍ය අවශ්‍යතා හඳුනාගෙන වාර්තාවක් සකස් කිරීම.** 2019 වර්ෂයේදී කෝප කමිටුව මේ සඳහා අවශ්‍යතාව හඳුනාගෙන අවශ්‍ය නිර්දේශ ලබාදී ඇතත් මේ වනතුරු ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබීම පමිණිත්ධයෙන් කාරක සභාව තම අප්‍රසාදය පළ කරලේය.	දුම්රිය දෙපාර්තමේන්තුව සතු දේපළ බලුදීම සඳහා කාර්යක්ෂම තොරතුරු පද්ධතියක් සකස් කරන ලද බවත් 2024 ජූලි මස 15 දින වනවිට අදාළ බදු දී ඇති දේපළ නියමානුකූලව කිරීමට කටයුතු කරමින් පවතින බවත් ප්‍රධාන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.නි. ප්‍රකාශ කරලේය. **නිරීක්ෂණය/ නිර්දේශය** දුම්රිය දෙපාර්තමේන්තුවට තොරතුරු තාක්ෂණ අංශයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දුන් කාරක සභාව මේ සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගනිමට අපේක්ෂිත ඉදිරි පියවර සම්බන්ධයෙන් සකස් කළ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රධාන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත නිර්දේශ කළේය. **ප්‍රධාන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අංක MT/04/14/03/02-2024 සහ 2024.07.17 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**	දුම්රිය දෙපාර්තමේන්තුවේ 1996 වර්ෂයේදී පමණ "දත්ත සැකසුම් අංශය" නමින් අංශයක් ස්ථාපනය කරන ලද අතර එමඟින් වැටුප්පත් සැකසීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබීය. ඉන් අනතුරුව 2017දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට නිලධාරීන් පැමිණීමත් සමඟම තොරතුරු පද්ධතීන් සංවර්ධනය ආරම්භ කරන ලදී. 2024 අගෝස්තු මස අංශය නවීකරණය කරන ලද අතර එහි නාමය "තොරතුරු තාක්ෂණ ඒකකය" ලෙස වෙනස් කර ගැනීම සඳහා සකස් කරන ලද සංකල්ප පත්‍රය (Concept Paper) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) වෙත යොමු කර ඇත. දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ඒකකය ශ්‍රීලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආඥාපනයේ සහකාර අධ්‍යක්ෂවරියන් දෙදෙනෙකු යටතේ පහත කාර්යමණ්ඩල ව්‍යුහය සහිතව ක්‍රියාත්මක වේ. ▪ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී: 01 ▪ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර: 12 (මින් නිලධාරීන් දෙදෙනෙකු ඉඩම් අංශයට තාවකාලිකව අනුයුක්ත කර ඇත.) ▪ කාර්යාල කාර්ය සහායක : 02 තොරතුරු තාක්ෂණ ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ විවිධ අවශ්‍යතා හඳුනාගෙන මෘදුකාංග සංවර්ධනය සිදු කිරීම, දෘඩාංගවල දෝෂ නිරාකරණය කිරීම, ජාලකරණ කටයුතු සිදු කිරීම යනාදී සියලුම තොරතුරු තාක්ෂණික ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. ඒ සඳහා හැකියාව සහිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් අවශ්‍ය වේ. (මේ වන විට එක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරියෙකු සහ උක්ත කරුණු සිදු කිරීමට

			නිපුණතාවය පවතින කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 05 දෙනෙකු පමණක් සිටී.) එබැවින් කාර්යමණ්ඩල ව්‍යුහය වෙනස් කිරීම උදෙසා වන යෝජනාද (කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු ප්‍රමාණය 05ක් දක්වා ඉහල නංවා ගැනීම) මේ වන විට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) වෙත ඉදිරිපත් කර පවතී.
06	**දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ වත්කම් හා ඒවා බදුදීම් පිළිබඳව යාවත්කාලීන කොරතුරු ලබා ගැනීම** 2019 ජූනි මස 21 දින පැවති රජයේ ඔඟුම පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නිර්දේශ ප්‍රකාරව දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිගණක ගත කිරීම සිදුවී නොමැති බවත් ඉඩම් බදු දීම වලට අදාළ රු. මිලියන 79ක මුදල් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවට ලැබී නොමැති බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.	වර්තමානයේ දී රට පුරා විසිරී පවතින දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හඳුනාගෙන ඇති බවත්, ආයෝජනවූ සංවර්ධන බැංකුව හා එක්ව එම ඉඩම් පරිගණක ගත කිරීමේ වැඩසටහනක් ආරම්භ කර තිබෙන බවත්, වුධියන නගරේ ආශ්‍රිත ඉදිපළ දැනටමත් පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇති බවත්, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉදිපළ වල පදිංචිකරුවන්ට 2024 ජූලි 15 වන දින දක්වා ලියාපදිංචි වීමේ කාලසීමාවක් ද ලබා දී ඇති බවත්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුකාරමයක් හඳුනාගෙන් ලියාපදිංචි වී නොමැති හා අනවසර පදිංචිකරුවන්ට එරෙහිව මහජනීක පියවරයන් ගැනීමට බලාපොරොත්තු වන බවද ඉහතකම් ප්‍රකාශ කළේය.	බාහිර සමපත් දායකයෙක් විසින් ඉකුත් කරන ලද අදාල පරිගණකගත පද්ධතිය 2025 වර්ෂයෙන් පසු යාවත්කාලීන කිරීමට අප්‍රිය වී ඇත. අදාල සැපයුම් දායකයා දැනට ඉටුවිය යුතු ගිවිසුම්ගතවීමක් නොමැති බැවින්, පද්ධතිය [illegible] සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොමැත. ඒ අනුව දෙපාර්තමේන්තු කොරතුරු තාක්ෂණ [illegible] නව පද්ධතියක් මේ වන විට සකස් කර ඇත. ස.අධ්‍යා. තො හා සං.තා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොරතුරු තාක්ෂණ [illegible] ඉඩම් බදු දීම් කළමනාකරණය සඳහා Property Management System (PMS) ලෙස කොරතුරු පද්ධතියක් සංවර්ධනය කර පවතී. මේ වන විට කොළඹ, අනුරාධපුර සහ නාවලපිටිය යන ඉඩම් අංශ මඟින් දත්ත ඇතුළත් කර අවසන් අතර මේ වන විට දත්ත සත්‍යාපනය කරමින් පවතී. Link: https://pms.railway.gov.lk/backoffice/


නිරීක්ෂණ/ නිර්දේශ

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් වන්කම පිළිබඳව දත්ත ඇතුළත් කොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ වාර්තාවක් 2024 අගෝස්තු 5 දින වනවිට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසර පදිංචිවීම් හා ලියාපදිංචිවීම් සංඛ්‍යාව පිළිබඳව සකස් කළ සම්පූර්ණ වාර්තාවක් 2024 සැප්තැම්බර් 15 දින වනවිට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේ.ප.නි./ ග.නී. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.08.05 හා 2024.10.02 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.


Division Wise File Count

Railway Division	Total Files
NVP	3089
ANP	1191
Total	6469




Division Wise Active Leases Count

Railway Division	Total No. of Leases
NVP	3
ANP	3
Total	6



Land Extent by Railway Division (Hectares)

Railway Division	Total Area (Hectares)
NVP	254.770
ANP	121.834
Total	506.457



සභ්‍යාපනයෙන් පසුව මෙම කොරතුරු සංශෝධනය විය හැක.


මෙහි දෙවන අදියර ලෙස දුම්රිය ඉඩම් සඳහා ඉල්ලුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීම සඳහා ද පද්ධතිය වැඩිදියුණු කරමින් පවතින අතර කළමනාකාරීත්වයේ අනුමැතිය මත එයද නුදුරු අනාගතයේදී මහජනතාව වෙත ලබා දීමට නියමිත වේ.

07	<u>වැලිගම දුම්රිය ස්ථානය අසල දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමියෙහි කාණ්ඩ 14කින් යුතු ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකිරීම</u>	මෙහිදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් අදාළ නිලධාරීන්ට එරෙහිව නීති ක්‍රියාමාර්ග නොගෙන අදාළ වගකීම් එම නිලධාරීන් වෙත පවරමින් විගණකයෙන් නිදහස්වීමට කැන්සිරිම පිළිබඳව කාරක සභාව අප්‍රසාදය පළ කරෙල්ය. <u>නිරීක්ෂණ/ නිර්දේශ</u> මෙම අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් අදාළ දුම්රිය ස්ථානාධිපතිවරුන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙසත් ඒ සඳහා ඉදිරියට මෙවැනි දැ සිදුවීම වැළැක්වීමට කටයුතු කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	වැලිගම දුම්රිය ස්ථානය අසල දුම්රිය රක්ෂිතයෙහි මෙම අනවසර ඉදිකිරීම හා අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් කරන ලද කාලය නිශ්චිතව හඳුනා ගත නොහැකි බැවින්, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු දුම්රිය ස්ථානාධිපතිවරුන් කවුද යන්න නිශ්චය කර ගත නොහැකි වී ඇත. එසේම මෙම ගොඩනැගිලි ඉදිකර ඇතැයි අනුමාන කරන අවධියේ වැලිගම දුම්රිය ස්ථානයේ සේවය කරන ලද දුම්රිය ස්ථානාධිපතිවරුන් සියළු දෙනා මේ වන විට සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම කරුණු හේතුවෙන් මෙම අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් අදාළ දුම්රිය ස්ථානාධිපතිවරුන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට හැකියාවක් නැත. අනවසර පරිහරණය වැළැක්වීම සම්බන්ධයෙන් අදාළ නියෝග වක්‍රලේඛ අංක : 12/2022 නිකුත් කර ඇති බැවින් ඉදිරියට මෙවැනි දැ සිදුවීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර එම වක්‍රලේඛය අනුව සලසා ගනු ලබන බව ද දන්වමි.

08	කාණ්ඩ ලැබීම් කාර්යක්ෂම කර ගැනීමෙන් තොරව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 95ක පමණ වටිනා මුදල් සැපයුම්කරුවන් වෙත ගෙවීම් සිදුකර තිබීම හා 2020 වර්ෂය අවසානය වන විට භාවිතා කළ නොහැකි මිටවමකින් රු. මිලියන 298ක කාණ්ඩ තොග ගබඩා තුළ තිබීම සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානයට ලක්විය.	එමෙන්ම අදාළ සැපයුම්කරුවන්ගෙන් කාණ්ඩ ලැබීමකින් තොරව අදාළ මුළු මුදල් සැපයුම්කරුවන් වෙත නිදහස් කිරීම් අණිතයේ සිට භාවිතා කළ වැරදි ක්‍රියා පටිපාටියක් බවත්, දුම්රිය දෙපාර්තමේන්තුව සුළු ප්‍රමාණයෙන් කාණ්ඩ මිලදී ගැනීම් හේතුවෙන් අදාළ සැපයුම් සඳහා ප්‍රසම්පාදන ලබා ගැනීමට එම ක්‍රියාමාර්ගය අනුගමනය කළ බවත්, වර්තමානයේ කාණ්ඩ ලැබීමට පූර්වයෙන් අදාළ මුදල් ප්‍රමාණයෙන් 80% ක ගෙවීම් පමණක් සිදුකිරීමට නිර්දේශයක් ද සිදුකළ බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව නතුවේ ප්‍රකාශ කරන ලදී. **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** දුම්රිය අමතර කොටස් ආනයනය කිරීම හා තොග කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මීට වඩා විනිමින් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව උපදෙස් දුන්නේය.	මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අංක MT/07/02/04/65 හා 2026.04.22 දිනැති ලිපිය මගින් ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇති අතර, අදාල කමිටුවේ නිර්දේශ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.
09	**<u>2019 ජූනි මස 21 දින පැවති රජයේ කියුම් මිළිබඳ කාරක සභා රැස්වීමේ දී සංකේතාංක 01 හි ඇති එන්ජින් 10ක් ආනයනය කිරීම මිළිබඳව හා එසේ ගෙන්වන ලද දුම්රිය එන්ජින් වැඩීන් කිහිපයක් භාවිතයට නොහැ</u>**	මෙවැනි ආනයනයන්හි දී තාක්ෂණික විෂයයෙන් සියලු කාරණා සංජ්ඤා කිරීම ප්‍රායෝගික නොවන බවත්, අනානුකූලතාවයන් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමඟ යම් එකඟතාවයන්ට පැමිණි බවත්, අදාළ ණය පහසුකම් ලබාදුන් ඉන්දීය බැංකුව විසින් පනවන ලද ණය කොන්දේසි අනුව මිටුවක් විසින් නම්කළ සැපයුම්කරුවන් අතුරින්	මෙම එන්ජින් 10 ධාවන තත්ත්වයේ පැවතුනි. මේ වන විට මෙම එන්ජින් 200,000 km ඉක්මවා ධාවනය කර ඇත. එම එන්ජින් අතුරින් එන්ජින් 5ක් දැනට ධාවන තත්ත්වයේ ඇති අතර, තවත් එන්ජින් 4ක රෝද මාරු කිරීම සඳහා (ධාවනයේ යෙදීම නිසා ගෙවීම හේතුවෙන්) නතර කර ඇත. ඉතිරි එන්ජිම විදුලි පද්ධතියේ දෝෂයක් හේතුවෙන් නඩත්තුව සඳහා නතර කර ඇත.

	කෙංගිමීම ඇමෙරිකාවෙන් මිට වඩා අඩු මුදලකට දුම්රිය එන්ජින් ලබාගත හැකිව තිබීම හා ගෙන්වන ලද එන්ජින් සඳහා වූ තාක්ෂණික පිරිවිතර 46 කින් 17ක් අනුකූල වීමත්, සමස්ත හනුදෙනුව සරසවි රජයට රුපියල් මිලියන 1905 ක පාඩුවක් සිදුවීම පිළිබඳවත් කාරක සභාවේ අවධානයට ලක් විය.	සැපයුම්කරුවෙකු තෝරාගැනීමට සිදුවූ බවත්, මෙහිදී කරුණු දක්වමින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව නම්‍යවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම, ආනයනය කළ දුම්රිය එන්ජින් අතුරින් එක් එන්ජිමක් දුරුණු ලෙස අනාකූරකට භාජනය වීම නිසා අමිතර කොටස් ආනයනය කරන තුරු රේල්වේ දුම්රිය අංශයේ පවතින බවත්, ඉතිරි එන්ජින් 9ම ධාවන තත්ත්වයේ පවතින බවත්, ඉන් 4ක රෝද ගෙවී යාම නිසා රෝද මාරු කිරීම සඳහා නවීකෘත කිරීමක් බවත්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාවේ නම්‍යවේ ප්‍රකාශ කරන ලදී.	එක් එන්ජිමක් බැර අලුත්වැඩියාවන් සඳහා රත්මලාන වෙත යවා ඇත. මේ වන විට එන්ජින් 04ක් ධාවන තත්ත්වයේ පවතී. එන්ජින් 04ක රෝද ගෙවී යාම නිසා රෝද මාරු කිරීමට අංගනයේ නවතා ඇත. එක් එන්ජිමක වායු සම්කරණ පද්ධතිය අලුත්වැඩියා කරමින් පවතී.
10	**විගණකාධිපතිවරයාගේ ලිඛිත සටහනෙහි අඩංගු කරුණු (2024.06.05 දින රැස්වීමෙදී සාකච්ඡාවට ගනනොලැබූ විගණන කරුණු)**	**නිරීක්ෂණ/ නිර්දේශ** 2024.06.05 දින රැස්වීම සඳහා විගණකාධිපතිවරයා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද විගණන ලිපියේ සටහනෙහි (Brief Note) අඩංගු, එහෙත් අද දින සාකච්ඡාවට නොගත් මාතෘකා වලට අදාළ විගණන විමසුම් සම්බන්ධව සභාපතිතුමාගේ පිළිතුරු වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වන විට කාරක සභාවේ වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ක.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේඛණයේ අංක **MT/04/14/03/02-2024 හා 2024.08.05** දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.	රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර එහි ප්‍රගතිය MT/04/14/03/02-2024 හා 2024/05/28 දිනැතිව, MT/04/14/03/02-2024 හා 2024/09/06 දිනැතිව, MT/04/14/03/01-2025 හා 2025/05/02 දිනැතිව, MT/04/14/03/01-2025 හා 2025/08/13 දිනැතිව, සහ MT/04/14/03/01-2025 හා 2025/11/13 දිනැතිව රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාව වෙත ලිපි ලේඛණ ඉදිරිපත් කර ඇත.

11	අලුතෙන් අමුරුවට ගෙන්වන ලද දුම්රිය එන්ජින්වල නඩත්තු කටයුතු සිදුකළ හැකි අයුරින් දුම්රිය අළුත්වැඩියා කිරීමේ අංගන පුළුල් කිරීම සම්බන්ධයෙන් ඩැබිළිලවලක් සකස් කිරීමේ අවශ්‍යතාවය	දුම්රිය සේවය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා ලබා දෙන ලෙසට අමාත්‍යය මණ්ඩලය මගින් කමිටුවක් පත්කර ඇති බවත් එම වාර්තාව අමාත්‍යය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තවත් කමිටුවක් මඟින් වාර්තාවක් ඉල්ලා ඇති අතර එය අමාත්‍යය මණ්ඩලයට එළඹෙන කණිගේදී පිළිතුන්වීමට නියමිත බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ඇ.නි. විසින් කාරක සභාව නමුලව් ප්‍රකාශ කරන ලදී.	අළුතින් මෙරටට ගෙන්වන ලද දුම්රිය එන්ජින්වල නඩත්තු කටයුතු සිදුකළ හැකි අයුරින් දුම්රිය අළුත්වැඩියා පහසුකම් දියුණු කිරීම යටතේ, රත්මලාන කර්මාන්තශාලා අංක 28,29 නවීකරණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. නව බලවේග කටටල අළුත්වැඩියා කිරීම සඳහා රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු අංගනය තුළ නව කර්මාන්තශාලාවක් මේ වන විට ඉදි කරමින් පවතී. මාළිගාවත්ත අංගනයට යාබදව ඇති ස.කො.ස. ගබඩා තිබූ ප්‍රදේශය සංවර්ධනය කර පිරිසිදු කිරීමේ පහසුකාවයන් සහිතව (Washing bay facility) මෙන්ම, අංගනයන් සඳහා සැලැස්මක් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) සකස් කර ඇත.
12	දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කිරීම, මිනිස් සම්පත කළමනාකරණය කිරීම හා දුම්රියෙන් තාක්ෂණ ප්‍රවාහනය ප්‍රවලිත කිරීම	**කිරීත්මණ්ඩ/ කිර්තද්ධ** දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කිරීම, මිනිස් සම්පත කළමනාකරණය කිරීම හා දුම්රියෙන් තාක්ෂණ ප්‍රවාහනය ප්‍රවලිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර පිළිබඳව සකස් කළ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ඇ.නි./ ඇ.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අංක MT/04/14/03/02-2024 හා 2024.08.05 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**	දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ඒකකය විසින් මානව සම්පත් කළමනාකරණය සඳහා Railway Employee Master Information System (R E M I S) යන පද්ධතිය සංවර්ධනය කර ඇති අතර මෙම පද්ධතිය හරහා නිලධාරීන්ගේ පුද්ගලික ලිපි ගොනුවේ සඳහන් වාර්තා සඳහා අත්‍යවශ්‍ය දත්ත (පත්වීම්, මාරුවීම්, පුනුණු, විශ්‍රාම යාම, ස්ථාන මාරු, යනාදිය) ඇතුලත් කර පවතී. මේ වන විට පහත සඳහන් ලෙස සියලුම කැබිනට් භාර පරිපාලන නිලධාරීන් විසින් දත්ත ඇතුලත් කර ඇත. Link: https://remis.railway.gov.lk/sysemp/



කළමනාකාරීත්වයේ සහ නිලධාරීන්ගේ අවශ්‍යතා අනුව තවදුරටත් පද්ධතිය සංවර්ධනය කරමින් පවතී.

මහජනතාව සමඟ සෘජුව සම්බන්ධතා පවත්වන රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මත පිහිටා මහජනතාව සමඟ මනා සන්නිවේදනයකින් යුතුව රාජකාරී ඉටු කිරීමට හැකිවන අයුරු කාලීන අවශ්‍යතා මත සේවක ආකල්ප ප්‍රවර්ධනය කරමින් විවිධ ක්ෂේත්‍ර හරහා පුහුණු වැඩ සටහන් දියත් කර ඇත.

බිමල් නිරෝෂන් රත්නායක (පා.ම)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

ඇමුණුම 01

තෘතීයික මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

තනතුර	අදාළ වන සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	2026.03.31 දිනට නිලධර සංඛ්‍යාව			
				අනුමත	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු	පුරප්පාඩු පිරවීම් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
ලේඛකාධිකාරී	Dept	Special	MN 7	1	0	1	සම්මුඛ පරීක්ෂණය ලේඛණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.
පරිපාලන නිලධාරී	PMAS	Supra	MN 7	31	08 අධි සේවක පදනම මත නිලධාරීන් 02 ක් සිටී	22	දුම්රිය ලිපිකාර සේවය රාජ්‍ය කළමනාකරන සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු වන බැවින් දුම්රිය ලිපිකරු අධි පන්තිය සඳහා හිමි තනතුරු ප්‍රමාණය පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විමසා ඇත.
පුහුණු කිරීමේ නිලධාරී	Dept	Special	MN 7	5	0	5	උපදේශක තනතුරේ සුදුසුකම් සහිත නිලධාරීන් නොමැත
දුම්රිය එන්ජින් රියදුරු(විශේෂ පන්තිය)	SLTS	Special	MN 7	58	0	58	සීමිත පදනම් මත විභාගය සමත් ප්‍රතිඵල ලේඛණය හා කුසලතා පදනම් මත කඳවීම් නිවේදන කෙටුම්පත හා ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2025.07.29 දින යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් රා.සෙ.කොං.විසින් විමසීම් සිදු කර අති අතර ඒ සඳහා තොරතුරු මෙම සතිය තුල යොමු කිරීමට කටයුතු කළ හැකිය.
පර්යේෂණ සහකාර	SLTS	Special	MN 7	1	0	1	විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් සඳහා 1 ශ්‍රේණියේ නිලධාරීන් නොමැත
දුම්රිය ස්ථාන අධිකාරී	Dept	Special	MN 7	2	0	2	දුම්රිය ස්ථාන අධිකාරී තනතුරට උසස් කරනු ලබන්නේ දුම්රිය ස්ථානාධිපති අධි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් වන අතර දුම්රි ස්ථානාධිපති අධිශ්‍රේණියේ නිලධාරීන් නොමැති වීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට ප්‍රමාද වී ඇති අතර මේ වන විට නිලධාරීන් 25 ක් අධි ශ්‍රේණියට උසස් කර ඇති බැවින් ඔවුන් අතරින් මෙම තනතුරු සඳහා පත්කිරීමට කටයුතු කරමින් පවතී.
නියාමක පරීක්ෂක	Dept	Special	MN 7	1	0	1	නියාමක පරීක්ෂක තනතුරේ වැටුප් පියවර සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වය හේතුවෙන් බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමට නොහැකි වී ඇති අතර වැටුප් පියවර සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් සමඟ කටයුතු කරමින් පවතී.
ප්‍රධාන දුම්රිය පාලක	Dept	Special	MN 7	1	0	1	ප්‍රධාන දුම්රිය පාලක තනතුරට උසස් කරනු ලබන්නේ දුම්රිය ස්ථානාධිපති අධි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් වන අතර දුම්රි ස්ථානාධිපති අධිශ්‍රේණියේ නිලධාරීන් නොමැති වීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට ප්‍රමාද වී ඇති අතර මේ වන විට නිලධාරීන් 25 ක් අධි ශ්‍රේණියට උසස් කර

							දැනට බැඳීන් ඉවතුන් අසිරින් මෙම තනතුරු සඳහා පත්කිරීමට කටයුතු සූරම්න් පවතී.
ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (දුම්රිය ස්ථාන කාර්යභාර)	Dept	Special	MN 7	50	25	25	සිමිත පදනම් මත 16 දෙනෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය සකසා අනුමැතිය සඳහා 2025.05.10 රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.
ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර)	Dept	Special	MN 7	10	5	5	කුසලතා පදනම් මත 2025.02.06 දින පත්වීම් 44 ක් ලබා දී ඇති අතර මේ වන විට නිලධාරීන් 14 ක් විශ්‍රාම ලබා ඇත.
පරීක්ෂක	Dept	Special	RS 4	15	8	7	
පරීක්ෂක (කාන්තා)	Dept	Special	RS 4	1	0	1	සුදුසුකම් සහිත නිලධාරීන් නොමැත
නියාමක	SLTS	Special	MN 7	65	10	55	සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම සඳහා හා අයදුම්පත් කැඳවීමේ නිවේදනය සකසා ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් රා.සෙ.කොා. විසින් සිදු කර ඇති විමසීම්වලට අදාළව තොරතුරු මෙම සභිය තුල යොමු කල හැකි.
සැලසුම් ශිල්පී (සිවිල්)	SLTS	Special	MN 7	3	0	3	සුදුසුකම් සහිත නිලධාරීන් නොමැත.
සැලසුම් ශිල්පී (සංඥා)	SLTS	Special	MN 7	1	0	1	සුදුසුකම් සහිත නිලධාරීන් නොමැත.
සැලසුම් ශිල්පී (යාන්ත්‍රික)	SLTS	Special	MN 7	2	0	2	සුදුසුකම් සහිත නිලධාරීන් නොමැත.
දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික)	SLTS	Special	MN 7	22	0	22	විභාග පැවැත්වීම් සඳහා අයදුම්පත් කඳවා අවසන්. විභාගය2026.07.05 දින පැවැත්වේ.
ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර)	Dept	Special	MN 7	8	0	8	පත්වීම් ලබා දීම සඳහා සම්මුඛ පරීක්ෂණ උප ලේඛණ 22026.06.12 දින රා.සෙ.කොා. වෙත යොමු කර ඇත.
අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර)	Dept	Special	MN 7	8	2	6	
ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා)	Dept	Special	MN 7	5	0	5	
අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා)	Dept	Special	MN 7	11	2	9	
ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග)	Dept	Special	MN 7	8	0	8	
ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි)	Dept	Special	MN 7	6	0	6	
ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (පාලම්)	Dept	Special	MN 7	1	0	1	
අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග)	Dept	Special	MN 7	47	1	46	
අධීක්ෂණ කළමනාකරු (පාලම්)	Dept	Special	MN 7	7	1	6	
අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි)	Dept	Special	MN 7	9	0	9	

2/10 ලදිනි

මුද්‍රිත පරීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ)	Dept	Special	MN 7	7	0	7	
අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ)	Dept	Special	MN 7	13	12	1	
බඩු ගබඩා පාලක	Dept	Special	MN 7	1	0	1	බඩු ගබඩා පාලක තනතුරට උසස් කරනු ලබන්නේ දුම්රිය ස්ථානාධිපති අධි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් වන අතර දුම්රි ස්ථානාධිපති අධිශ්‍රේණියේ නිලධාරීන් නොමැති වීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට ප්‍රමාද වී ඇති අතර මේවන විට නිලධාරීන් 44 ක් අධි ශ්‍රේණියට උසස් කර ඇති බැවින් ඔවුන් අතරින් මෙම තනතුරු සඳහා පත්කිරීමට කටයුතු කරමින් පවතී.
දිස්ත්‍රික් පරීක්ෂක (ගමනාගමන හා වාණිජ)	Dept	Special	MN 7	26	5	21	විභාගය හා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් අතර සම්මුඛ පරීක්ෂණ ලකුණු සංශෝධන කර සම්මුඛ පරීක්ෂණ උප ලේඛණය සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2025.11.06 යොමු කර ඇත.
අංගනාධිපති	Dept	Special	MN 7	2	0	2	අංගනාධිපති තනතුරේ වැටුප් පියවර සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වය හේතුවෙන් බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමට නොහැකි වී ඇති අතර වැටුප් පියවර සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් සමඟ කටයුතු කරමින් පවතී.
රියදුරු කාර්යභාර නිලධාරී	SLTS	Special	MN 7	9	0	9	සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය, හා ලකුණු පටිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා 2025.04. 07 යොමු කර ඇත. මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.
නියාමක කාර්යභාර නිලධාරී	SLTS	Special	MN 7	9	0	9	බඳවා ගැනීම් පටිපාටි කෙටුම්පත නිරීක්ෂණ නිර්දේශ සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.
භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ)	TS	II/I	MN 6	4	3	1	මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත දෙමළ පරිවර්තක පුරප්පාඩුවක් ඇත.
කොරතුරු තාක්ෂණ නිලධාරී	SLICTS	2-II/I	MN 6	1	1		
එකතුව				451	85	366	

ඇමුණුම 02

බඳවා ගැනීමේ ප්‍රගතිය

අනු අංකය	තනතුරු නාමය	වැටුප් කේතය	2022 /2024 වර්ෂයේ බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සංඛ්‍යාව	2025.02.09 බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සංඛ්‍යාව	2025.03.10 බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සංඛ්‍යාව	2025.12.16 බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සංඛ්‍යාව	බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද මුළු සංඛ්‍යාව	බඳවා ගත් සංඛ්‍යාව	බඳවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
02	දුම්රිය ස්ථානාධිපති	Railway 2025	-	-	106		106	91	ඉතිරි 15 දෙනා බඳවා ගැනීම සඳහා විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලේඛණයක් විභාග දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.
03	දුම්රිය නියාමක	Railway 2025	63	-	73		136	6	ඉතිරි පුරප්පාඩු 130 සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා සුදුසුකම් සංශෝධනය කර නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
04	දුම්රිය එන්ජින් රියදුරු	Railway 2025	100	-	92		192	115	ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
05	අධීක්ෂණ කළමනාකරු	Railway 2025	80	-	89		169	107	ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
11	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික)	MT-02	-	136	127		263	193	ඉතිරි පුරප්පාඩු 70 සඳහා නැවත අයදුම්පත් කැඳවීමට කටයුතු කරමින් පවතී.
12	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි)	MT-02	-	17	30		47	47	
13	මූලික තාක්ෂණ ශිල්පී	MT-01	-	-	384		384	92	ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම් සුදුසුකම් සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය

									සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී.
14	උපදේශක	MN-03	-	-	08		08	6	
15	රියදුරු සහායක	MT-01	100				100		විභාග ප්‍රතිඵල ලැබී ඇති වෘත්තීය පරීක්ෂණ 2025.05.20 දින සිට පැවැත්වේ.
16	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	SL-01				2	2		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
17	නීති නිලධාරී	SL-01				1	1		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
18	සහකාර අධිකාරී - දු.ආ.සේ	SL-01				2	2		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
16	ප්‍රසම්පාදන නිලධාරී	MN-04				4	4		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
17	ගමනාගමන පිරිවැය නිලධාරී	MN-04				2	2		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
18	සැලසුම් ශිල්පී (යාන්ත්‍රික)	MN-03				7	7		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
19	සැලසුම් ශිල්පී (විදුලි)	MN-03				1	1		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
20	සැලසුම් ශිල්පී (සිවිල්)	MN-03				8	8		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
21	පර්යේෂණ සහකාර	MN-03				4	4		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
22	දුම්රිය ආරක්ෂක (පිරිමි)	RS-01				131	131		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
23	දුම්රිය ආරක්ෂක (කාන්තා)	RS-02				10	10		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
24	බංගලා භාරකරු	PL-03				22	22		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
25	නවාතැන් බංගලා භාරකරු	PL-01				20	20		අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.
එකතුව			**343**	**153**	**909**	**247**	**1652**	**657**	

2025.05.20